සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 06

I පත්‍රය

කාලය පැය 01 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* **ඔබේ විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/I/S/CH

ලබා දෙන දිනය - 2026.08.04 පෙ.ව. 11.15 සිට ප.ව. 12.15 [දෙවැනි පිටුව බලන්න.

01. පහත රූපය නිරීක්ෂණය කරන්න. ඒ පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(1) කාන්තාවක් රෙදි සෝදමින් සිටියි.

(2) අහසේ කුරුල්ලෝ දෙදෙනෙක් පියාඹමින් සිටිති.

(3) ළමයාගේ වම් අතේ මලක් තිබේ.

02. පහත රූපයේ A සහ B ලෙස සටහන් කර ඇති හිස්තැන් සඳහා පිළිවෙළින් ගැළපෙන රූප කොටස් දෙක මොනවා ද?





(1)




(2)



(3)

03. පහත සඳහන් A, B, C, D, E යන රූපවලින් සමාන රූප දෙක මොනවා ද?




(1) A සහ C

(2) B සහ D

(3) C සහ E

04. ඊතලය ඇඳ ඇති කොටුවට ආ යුතු රූපය තෝරන්න.



(1) 

(2) 

(3) 

05. වත්තක එක පෙළට කොස්, දෙල්, අඹ, පුවක් සහ රඹුටන් ගස් සිටුවා තිබුණේ පහත ආකාරයට ය.

★ කොස් සහ අඹ එක ළඟ සිටුවා නැත.

★ කොස් සහ රඹුටන් ගස් දෙක අතර පුවක් ගස සිටුවා ඇත.

★ දෙල් සහ පුවක් ගස් එක ළඟ සිටුවා නැති අතර අවසානයට සිටුවා ඇති ගස රඹුටන් ගසකි.

ඒ අනුව මුලින් ම සහ මැද සිටුවා ඇති ගස් දෙක පිළිවෙළින්,

(1) දෙල් සහ පුවක් (2) පුවක් සහ දෙල් (3) අඹ සහ කොස්

- සකල්ගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

06. කුසල් වෙළඳසැලකට ගොස් පහත සඳහන් ද්‍රව්‍ය මිල දී ගත්තේ ය.

ඔහු මිල දී ගත් ආකාරය පහත දැක්වේ.

★ පෑන් ගණන සහ මකන ගණන සමාන වේ.

★ පැන්සල් ගණන, පෑන් ගණනට වඩා 2 කින් වැඩි ය.


★ ඔහුට ගිය මුළු වියදම රු. 290.00 කි.

පැන්සලක්	⟶	රු. 25.00
මකනයක්	⟶	රු. 15.00
පෑනක්	⟶	රු. 40.00

එසේ නම් කුසල් මිල දී ගත් පැන්සල් ගණන කීය ද?

(1) 4 (2) 5 (3) 6

07. පහත රූපයේ දැක්වෙන්නේ A, B, C සහ D ස්ථාන අතර ඇති මාර්ග හා ඒවා ගමන් කිරීමට ගන්නා කාලයයි.



A සිට D දක්වා යෑමට ඕනෑම මාර්ගයකින් සෑම විනාඩි 30 කට වරක් බසයක් ධාවනය වේ. (පෙ. ව. 7.00, පෙ. ව. 7.30, පෙ. ව. 8.00 ...) කුමාර පෙ. ව. 7.10 ට A ස්ථානයට පැමිණියේ ය. ඔහුට හැකි ඉක්මනින් D ස්ථානයට ළඟා වීමට පහත මාර්ගවලට අනුව නිවැරදි පිළිතුර වන්නේ,

(1) A ⟶ C ⟶ D (2) A ⟶ B ⟶ D (3) A ⟶ D

08. පොත් ප්‍රදර්ශනයක දී යහළුවෝ තුන් දෙනෙක් පොත් ගත් ආකාරය පහත දැක්වේ.

★ අරුණිට වඩා බිමාෂා පොත් 2 ක් වැඩියෙන් ගත්තා ය.

★ චතුරි බිමාෂාට වඩා පොත් 3 ක් අඩුවෙන් ගත්තා ය.

★ තිදෙනා ම ගත් පොත් සංඛ්‍යාවේ එකතුව 19 කි.

එසේ නම් අරුණි ගත් පොත් සංඛ්‍යාව වන්නේ,

(1) 5 (2) 6 (3) 7

09. පහත දැක්වෙන්නේ පලතුරු ගෙඩි එක් වට්ටියකට තුනක් වන සේ වට්ටිවලට දැමූ ආකාරයයි.


★ අඹ ගෙඩියක් හෝ දොඩම් ගෙඩියක් ★ ගස්ලබු ගෙඩියක් හෝ අන්නාසි ගෙඩියක්

★ මැංගුස් ගෙඩියක් හෝ රඹුටන් ගෙඩියක්

මේ ආකාරයට එකිනෙකට වෙනස් වන පරිදි ආකාර කීයකට පලතුරු වට්ටි සකස් කළ හැකි ද?


(1) 3 (2) 6 (3) 8

10. පහත දැක්වෙන්නේ ත්‍රිකෝණ 3 කි. එම ත්‍රිකෝණ 3 යොදා ගනිමින් සකසා ඇති රූපය කුමක් ද?





(1)



(2)



(3)

11. කසුන් සහ නිමල් යන දෙදෙනා කාර්, බෝල, ප්ලේන්, බස් සහ සයිකල් යන සෙල්ලම් බඩු 5 ට කැමැත්ත දක්වන ආකාරය මෙසේ ය.

- නිමල් පමණක් සයිකල්වලට කැමති ය.
- කසුන් සෙල්ලම් බඩු වර්ග දෙකකට කැමති නැත.
- කසුන් සහ නිමල් යන දෙදෙනා ම කාර් සහ ප්ලේන්වලට කැමති ය.

මේ අනුව කසුන් කැමති නැති සෙල්ලම් බඩුවක් විය හැක්කේ,

(1) බෝල සහ ප්ලේන් ය. (2) සයිකල් සහ කාර් ය.

(3) බෝල සහ බස් යන දෙකෙන් එකක් විය හැකි ය.

12. පහත ඇති විස්තරයට අනුව සඳගිරි ගම පිළිබඳව සකස් කර ඇති නිවැරදි දළ සටහන කුමක් ද?

සඳගිරි ගම පිහිටා ඇත්තේ විශාල කඳු පන්තියක් පාමුල ය. කඳු මුදුනෙන් ආරම්භ වන මනරම් දිය ඇල්ල ගම මැදින් පහළට ගලා බැස ගම කෙළවරේ දී ගඟට එකතු වේ. ගඟට උතුරින් සහ දිය ඇල්ලට නැගෙනහිරින් කුමුදුගේ නිවස පිහිටා ඇත. දිය ඇල්ලට බටහිරින් වනාන්තරය පිහිටා ඇත. (සිතියම්වල ඉහළ දිශාව උතුර ලෙස සලකන්න.)

(1)



(2)



(3)



13. පහත දැක්වෙන්නේ එක්තරා සිදුවීමක අවස්ථා පහකි.

A - ගුරුතුමිය දරුවාගේ තුවාලයට ප්‍රථමාධාර ලබා දුන්නා.

B - ක්‍රීඩා කරන අතරතුර දරුවෙක් ලිස්සා වැටුණා.


C - මිතුරෝ වහාම ගුරුතුමියට ඒ බව දැනුම් දුන්නා.

D - ප්‍රථමාධාර ලැබූ දරුවා නැවත සතුටින් පන්තියට ගියා.


E - දරුවාගේ දණහිසට සුළු තුවාලයක් සිදු වුණා.

(1) A, B, E, C, D (2) B, E, C, A, D (3) B, E, A, C, D


14. හිස්තැනට ආ යුතු පිළිතුර තෝරන්න.




(1)



(2)



(3)



- අමාත්‍යාංශ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

15. තුෂාරි, ගීතිකා, නයනි යන යෙහෙළියන් තිදෙනා රතු, නිල් සහ කොළ පැහැති තොප්පි දමා ගෙන සිටිති. (පිළිවෙළට නොවේ.) ඔවුන් තිදෙනා බෝල බෝනික්කො සහ සරුංගල් සමඟ සෙල්ලම් කරති. රතු තොප්පිය දමා ගෙන සිටින අය බෝලය සමඟ සෙල්ලම් කරති. නයනි නිල් තොප්පිය පැලඳ නැත. ගීතිකා සරුංගලය යවයි. තුෂාරි රතු තොප්පිය පැලඳ නැත. එසේ නම් නයනි පැලඳ සිටින තොප්පියේ පාට සහ ඇය සෙල්ලම් කරන ද්‍රව්‍ය කුමක් ද?

(1) රතු තොප්පිය සහ බෝලය (2) නිල් තොප්පිය සහ සරුංගලය

(3) කොළ තොප්පිය සහ බෝනික්කා

16. අනිද්දාට පසු දවස සිකුරාදා නම් ඊයේට පෙර දවස කවදා ද?

(1) ඉරිදා (2) සඳුදා (3) අඟහරුවාදා

17. A, B, C යනු සමාන ජල ප්‍රමාණයන් අඩංගු භාජන තුනකි. පහත දී ඇති පියවර තුන අනුපිළිවෙළින් සිදු කරයි නම්, අවසානයේ භාජනවල ඇති ජල ප්‍රමාණ අනුව ඒවා අවරෝහණ පිළිවෙළට තැබූ විට,


පියවර 1 - A භාජනයේ ඇති ජලයෙන් හරි B අඩක් භාජනයට දමන ලදී.

පියවර 2 - B භාජනයේ ඇති ජලයෙන් හරි අඩක් C භාජනයට දමන ලදී.

පියවර 3 - C භාජනයේ ඇති ජලයෙන් හරි අඩක් නැවත A භාජනයට දමන ලදී.

(1) BCA (2) ACB (3) ABC

18. මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීය ද?



(1) 15

(2) 16

(3) 17

19. පහත දැක්වෙන්නේ මැජික් කැට භයකි.



මෙහි A බඳුනට රුපියලක් දැමූ විට තවත් රුපියලක් ලැබේ. B බඳුනට රුපියල් දෙකක් දැමූ විට තවත් රුපියල් 4 ක් ලැබේ. C බඳුනට රුපියල් තුනක් දැමූ විට තවත් රුපියල් 9 ක් ලැබේ. D බඳුනට රුපියල් 4 ක් දැමූ විට තවත් රුපියල් 16 ක් ලැබේ. ඒ අනුව එම රටාව අනුව කැට 6 ට ම මුදල් දැමූ විට ලැබෙන මුළු මුදල කීය ද?


(1) 55 (2) 65 (3) 91

20. පිට්ටනියේ රවුමකට ළමයි 35 දෙනෙක් එක සමාන දුරින් සිටගෙන සිටිති. ඔවුන් A, B, C ලෙස පිළිවෙළින් එකිනෙකා අංක කියාගෙන යති. පළමු ළමයා A ද, දෙවන ළමයා B ද, තෙවන ළමයා C ද ලෙස කියයි. මෙසේ අන්තිම ළමයා දක්වා ගමන් කළ පසු වැඩිපුර ම සිටින අකුරට අදාළ ළමයින් සංඛ්‍යාව කුමක් ද?

(1) A සහ B කණ්ඩායම් දෙකෙහි ය. (2) B සහ C කණ්ඩායම් දෙකෙහි ය.

(3) A, B, C යන කණ්ඩායම් තුනෙහි ම සමාන වේ.

- සම්මාදම් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

21. 

පහත දැක්වෙන්නේ ඝනකාභයේ සියලු ම ඝනක වෙන් කොට, එම ඝනක සමාන ගොඩවල් දෙකකට බෙදා එක් ගොඩක ඇති ඝනක පමණක් යොදා ගෙන නැවත ඝනකාභයක් සාදනු ලැබේ. එම ඝනකාභයේ උපරිම උස වන්නේ,

(1) 10cm (2) 20cm (3) 12cm

22. රවුම් මේසයක් වටා එක සමාන දුරින් නයනි, සාමා, මයුරි, දිලානි, රනීෂා සහ තරින්දි වාඩි වී සිටිති. නයනි සිටින්නේ දිලානිට ඉදිරියෙනි. රනීෂා සාමා ළඟ වාඩි වී සිටිති. ඒ අනුව තරින්දි ඉදිරියෙන් සිටිය නොහැක්කේ,

(1) රනීෂා (2) සාමා (3) මයුරි

23. පේර ගසක ගිරවු සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් ලේන්නු සිටිති. තව ගිරවු 12 ක් අඹ ගසට පැමිණියහොත් ගිරවු සහ ලේන්නු සංඛ්‍යාව සමාන වෙති. මෙසේ සමාන වූ විට ගසේ දැන් සිටිය හැකි මුළු සත්තු සංඛ්‍යාව කොපමණ ද?

(1) 32 (2) 36 (3) 42

24. පලතුරු වට්ටියක තිබූ පලතුරු සිසුන් කිහිප දෙනෙකුට බෙදා දෙන ලදී. නයනට සහ කමල්ට ලැබුණේ දොඩම් ගෙඩියක් බැගිනි. අමිල සහ නයනට ඇපල් ගෙඩියක් බැගින් ලැබුණි. නයනට කොමඩු ගෙඩියක් නොලැබුණු අතර සෙසු අයට කොමඩු ගෙඩියක් බැගින් ලැබුණි. එසේ නම් ඇපල් ගෙඩියක් සහ දොඩම් ගෙඩියක් ලැබුණේ කාට ද?

(1) කමල්ට (2) නයනට (3) අමිලට

25. අධික වර්ෂයක ජනවාරි 1 සිකුරාදා දවසකි. එම වර්ෂයට ඇති සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා දින ගණන පිළිවෙළින්,

(1) 53, 52, 52 (2) 53, 53, 52 (3) 53, 53, 53

◈ කසුන් වෛද්‍යවරයෙකු වෙත ගොස් ප්‍රතිකාර ලබා ගත්තේ ය. ඔහුට පෙත්ත බැගින් පැය 6 කට වරක් ද, කරල් 1 බැගින් පැය 8 කට වරක් ද බෙත් ගැනීමට නියම කළේ ය. ඔහු මෙම දෙවර්ගය ම එකවර සවස 5 ට ගත්තේ නම්,

26. පසුවදා උදේ 5 ට පෙති ගන්නේ කී වෙනි වරට ද?


(1) දෙවැනි වරට (2) තෙවැනි වරට (3) සිව්වෙනි වරට

27. මේ දෙවර්ගය ම දෙවැනි වරට එකවර ගැනීමට ලැබෙන්නේ කුමන වේලාවට ද?

(1) පසුදින ප. ව. 5.00 (2) පසුදින පෙ. ව. 1.00 (3) පසුදින පෙ. ව. 5.00

28. කාර්යාලයක පෙරවරු 7.45 ට මුලින් ම 12 දෙනෙක් පැමිණෙති. එතැන් සිට සෑම පැයකට වරක් ම 6 දෙනෙක් කාර්යාලයට පැමිණෙන අතර මිනිත්තු 30 කට වරක් දෙදෙනෙක් පිටව යති. පෙරවරු 11.30 වන විට කාර්යාලයේ රැඳී සිටින පුද්ගලයින් ගණන කීය ද?

(1) 26 (2) 28 (3) 30

29. 

සමචතුරස්‍ර හා ත්‍රිකෝණ හැඩැති කඩදාසි දෙකක් රූපයේ දැක්වෙන ආකාරයට තබා අංක 1 හා 2 යන කඩ ඉරිවලින් කැපුවේ නම් අපට ලැබෙන ත්‍රිකෝණාකාර කඩදාසි ගණන කීය ද?

(1) 4 (2) 5

(3) 6

30. දිනපතා අම්මාගෙන් ලැබෙන මුදල් මල්ලීත් මමත් ඉතිරි කරන්නේ කැටයකට දැමීමෙනි. මම දිනකට රුපියල් 2 බැගින් ද මල්ලී මුල් දිනයේ සත 50 ක් ද, දෙවන දිනයේ රුපියලක් ද, තුන්වන දිනයේ රුපියලයි සත පනහක් ද, හතරවන දිනයේ රුපියල් 2 ක් ද බැගින් දිනකට සත 50 බැගින් වැඩිවන ආකාරයට කැටයට මුදල් දමන ලදී. මුල් දින දහය තුළ මුදල් එකතු කිරීම පිළිබඳව කිව හැක්කේ,

(1) වැඩිපුර මුදල් එකතු කරන්නේ මම ය.

(2) වැඩිපුර මුදල් එකතු කරන්නේ මල්ලී ය.

(3) මට වඩා මල්ලී රුපියල් පහක මුදලක් එකතු කරන ලදී.

31. එක් ඉටිපන්දමක් දැල්වී තිබෙන කාලය මිනිත්තු 20 කි. අමල් ළඟ එවැනි ඉටිපන්දම් 5 ක් තිබුණි. ඔහු එකවර ඉටිපන්දම් 2 ක් දැල්වීය. ඒවා දැල්වී අවසන් වන විට ම තවත් ඉටිපන්දම් 2 ක් දැල්වීය. ඒවා ද නිවී යත්ම ඉතිරි ඉටිපන්දම දැල්වීය. ඉටිපන්දම් සියල්ල දැල්වී නිවී යාමට ගතවන මුළු කාලය කොපමණ ද?

(1) පැය 1 මිනිත්තු 40 (2) පැය 1 (3) මිනිත්තු 40


32. අඹ ගෙඩියක සහ දොඩම් ගෙඩියක මිලෙහි එකතුවට වඩා ඇපල් ගෙඩියක මිල වැඩි ය. ඇපල් ගෙඩියක සහ දොඩම් ගෙඩියක මිලෙහි එකතුවට වඩා ඇපල් සහ අඹ ගෙඩියක මිලෙහි එකතුව වැඩි ය. අඹ ගෙඩියක සහ ඇපල් ගෙඩියක මිලෙහි එකතුවට වඩා අඹ ගෙයඩික සහ කෙසෙල් ගෙඩියක මිලෙහි එකතුව වැඩි ය. මිල අඩු ම ගෙඩියේ සිට මිල වැඩි ම ගෙඩිය දක්වා පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) දොඩම්, අඹ, ඇපල්, කෙසෙල් (2) දොඩම්, අඹ, කෙසෙල්, ඇපල්

(3) අඹ, දොඩම්, ඇපල්, කෙසෙල්

33. ගුරුතුමියක ළමයි 7 දෙනෙකුගෙන් ළමයි 3 දෙනෙක් වන ලෙස සෑදිය හැකි එකිනෙකට වෙනස් ආකාරයේ කණ්ඩායම් ගණන කීය ද?

(1) 20 (2) 30 (3) 35

34. 

දල්වන ලද ඉටිපන්දම් පහක් එක්තරා මොහොතක දී ඉහත පරිදි දැල්වෙමින් තිබුණි. ඒ අනුව ඉටිපන්දම් දැල්වුණු කාලය වැඩිවන පිළිවෙළට ඇති පිළිතුර තෝරන්න.

(1) DBAEC (2) CEABD

(3) ABCDE

- සමස්ත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

◈ පහත දී ඇති දුර සටහන් පුවරු ඇසුරින් අංක 35 සහ 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



.....



ඇඹිලිපිටිය



රත්නපුර

35. පළමු පුවරුව පිහිටා ඇති නගරය කුමක් විය හැකි ද?

(1) බලංගොඩ (2) පැල්මඩුල්ල (3) නිවිතිගල

36. මිනිසෙක් ඇහැලියගොඩ සිට රත්නපුර පැල්මඩුල්ල හරහා ඇඹිලිපිටියට ගොස් එතැන් සිට කොලොන්නට ගියේ නම් ඔහු ගමන් කළ දුර සොයන්න.

(1) 133km (2) 153km (3) 60km

37. අමල්ගේ නිවසේ ආලින්දයේ සහ කාමරයේ ඇති ඔරලෝසුවලින් ආලින්දයේ ඇති ඔරලෝසුව පැයකට මිනිත්තු 20 ක් වැඩියෙන් ගමන් කරයි. කාමරයේ ඇති ඔරලෝසුව පැයකට මිනිත්තු 40 ක් අඩුවෙන් ගමන් කරයි. ඔරලෝසු දෙකෙහි ම වේලාව උදෑසන 4.00 ට නිවැරදිව සකස් කරන ලදී. එසේ නම් ඔරලෝසු දෙකේ ම කටු නැවත එම ආකාරයට ම පෙන්නුම් කරන්නේ පැය කීයකට පසුව ද?

(1) පැය 24 කට පසු (2) පැය 12 කට පසු (3) පැය 48 කට පසු


38. පහත ප්‍රකාශ ඇසුරින් ජංගම දුරකථනයේ මුරපදයට ගැළපෙන රටාව තෝරන්න.


★ පළමු ඉලක්කම මෙන් තුන්වන ඉලක්කම සිවු ගුණයකි.


★ ඉලක්කම් 2 ක එකතුව දෙවන ඉලක්කම මෙන් දෙගුණයකි.


★ ඔත්තේ සංඛ්‍යා 2 ක් සහ ඉරට්ටේ සංඛ්‍යා දෙකකින් සමන්විත ය.

★ මුරපදය ඉලක්කම් 4 කින් යුක්ත වේ.



(1) 

(2) 

(3) 

39. අකිල ළඟ එක් ගොඩක කාසි 5 ක් බැගින් යුත් ABCDE නැමති ගොඩවල් 5 ක් ඇත. මෙම කාසි ප්‍රමාණයෙන් හා හැඩයෙන් එක සමාන ය. නමුත් මෙම ගොඩවල් 5 න් එක් කාසි ගොඩක් ව්‍යාජ කාසි වේ. වලංගු එක් කාසියක බර 1g කි. ව්‍යාජ කාසියක බර 2g කි. අකිල ළඟ ඩිජිටල් තරාදියක් තිබේ නම් ව්‍යාජ කාසි ගොඩ හඳුනා ගැනීමට අනිවාර්යෙන් ම කාසි කිරා මැන ගත යුතු අවම වාර ගණන කීය ද?

(1) 1 (2) 3 (3) 4

40. භාජනයක ජලය ලීටර 2 මිලිලීටර 500 ක් තිබේ. එම භාජනයේ ඇති කුඩා සිදුරකින් සෑම මිනිත්තුවක දී ම ජලය මිලිලීටර 50 ක් බැගින් කාන්දු වී ඉවතට යයි. ඒ අනුව මෙම භාජනය සම්පූර්ණයෙන් ම හිස්වීමට ගතවන කාලය මිනිත්තු කීය ද?

(1) මිනිත්තු 40 (2) මිනිත්තු 50 (3) මිනිත්තු 55

සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 06
II පත්‍රය

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2026.08.04 පෙ.ව. 09.30 සිට පෙ.ව. 10.45

[දෙවැනි පිටුව බලන්න.

01. පහත සඳහන් ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සෙනසුරාදා සැන්දෑවක නිශාරි, තමාෂා සහ ගුවනි මුහුදු වෙරළට ගියහ. ඔවුහු මුහුදු වැලිවලින් කුඩා වැලි බත් සකස් කිරීම නිසා සතුටින් කාලය ගත කළහ. ටිකෙන් ටික සැන්දෑ හිරු රන්වන් ගිනි බෝලයක් මෙන් බටහිර අහසේ බැස යමින් අවට අහස රත් පැහැයෙන් බබළන්නට විය. සිසිල් මුහුදු සුළඟ ඔවුන්ගේ මුහුණු ස්පර්ශ කළ අතර මුහුදු රළ මෘදු හඬක් නඟමින් වෙරළට පැමිණියේය. ඈත මුහුදේ සෙමින් ගමන් කරන නැව් දෙස ඔවුහු ආසාවෙන් බලා සිටියහ. කුරුල්ලෝ තම කුඩු වෙත පියාසර කරමින් සිටි අතර මුළු පරිසරයම ඉතා සොඳුරු දසුනකින් පිරී තිබිණි. එම සුන්දර සැන්දෑව ඔවුන්ගේ මතකයේ රැඳී යන අපූරු අත්දැකීමක් විය.

✷ **ඡේදය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. නිශාරි, තමාෂා සහ ගුවනි ගියේ කොහේද? .....

2. ඔවුන් මුහුදු වෙරළේ කළේ කුමක්ද? .....

3. සැන්දෑ හිරු කෙසේ උපමා කර තිබේ ද? .....

4. පාපිලි තුන බැගින් සඳහන් වචන දෙකක් ඡේදයේ සඳහන් වේ. එයින් එක් වචනයක් ලියන්න. .....

5. ඈත මුහුදේ ඔවුන් දුටුවේ මොනවා ද? .....

6. කුරුල්ලෝ ගමන් කළේ කොතැනට ද? .....

7. ඡේදයේ ඉරි ඇඳි වැකිය වර්තමාන කාලයට හරවා ලියන්න.

.....

02. **පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

1. නිමාලි සහ අම්මා පොළට ..... (ගියෝ ය / ගියා ය)
2. ඌ ඉදුණු පේර ගෙඩියක් ..... (කෑවේ ය / කෑවෝ ය)
3. අයියා ද මම ද ක්‍රිකට් සෙල්ලම් ..... (කළෝ ය / කළෙමු)
4. ඔවුහු තම අදහස් ..... (පල කරයි / පල කරති)
5. විලේ ඕලු මල් ..... (පිපෙයි /පිපෙති)

03. **පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.**

1. බෝලය කන්දෙන් පහළට පෙරළෙයි.

.....

2. වෛද්‍යවරු රෝහලට පැමිණෙති.

.....

04. **පහත සඳහන් එක් එක් නාම පදය අයත් වන නාම පද වර්ගය තිත් ඉර මත ලියන්න.**

1. මිදුල - .....
2. පැන්සල - .....

05. **පහත දැක්වෙන එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචන දෙක බැගින් ඇත. එම වචන දෙක පමණක් නිවැරදි කර අදාළ තිත් ඉර මත ලියන්න.**

1. ඔවුහු මුක සෞකර්‍යය පිළිබඳව කවි නිර්මාණය කළෝ ය.

.....

2. පරිසරයේ හැමු සුලගක් සමග වැහි පොද මගේ ඇගට වැටුණි.

.....

06. **පහත යුගල පද සම්පූර්ණ කරන්න.**

1. අස්සක් ..... 2. විහිළු .....

07. **1. උත්තම පුරුෂ බහුවචන අතීතකාල ක්‍රියා පදයකි.**

(ගත්තෙමු / ගත්තෙමි)

2. ප්‍රථම පුරුෂ අතීතකාල බහු වචන ක්‍රියා පදයකි.

(වැටෙයි / වැටුණෝ ය)

08. **පහත දැක්වෙන වගන්තියෙහි අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.**

ඔවුන් පදිංචි ප්‍රදේශයට තල් අරඹ යැයි ගම්මු කියති

09. **පහත වචන නිවැරදි ව ගළපා වගන්තිය නැවත ලියන්න.**

ව්‍යාපාරය / සාධාරණ / තම / ව / ගෙන යයි / පවත්වා / ව්‍යාපාරිකයා

.....

10. **එක් එක් රූපයට ගැළපෙන වචනය දී ඇති කොටුතුළ ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.**

1. 

2. 

11. **පහත සඳහන් ඉංග්‍රීසි වචන නිවැරදිව ගළපා නිවැරදි වාක්‍යයක් සාදා ලියන්න.**

1. go / May / the / I / to / Office

……..

2. give / a / ruler / Please / me

…….

12. **පහත සඳහන් එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.**

1. Finger - …… 2. Fruit Juice - ……

13. ''නණ්ඩන්'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මම ඇතුළට එන්න ද?- .....

15. පහත සඳහන් සංඛ්‍යා දෙකෙන් විශාල ම සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

38 285 / 38 915


.....

16. පහත සඳහන් සංඛ්‍යා තුන අවරෝහණ පිළිවෙළට ලියන්න.

9287 , 9870 , 9789 - .....

17. 6 (7) 8 5 සංඛ්‍යාවේ රවුම් කළ සංඛ්‍යාව පිහිටි ස්ථානය සහ එම ඉලක්කමේ නිරූපිත අගය ලියන්න. .....

18. පහත රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....



19. | | |
|---|---|
| 9 | 3 |
| 4 | 0 |

පහත කොටුව තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි ඉලක්කම් හතරේ කුඩාම සංඛ්‍යාව සහ විශාලම සංඛ්‍යාව අතර වෙනස කීය ද? .....

20. පහත සංඛ්‍යා රටාවේ ඊළඟට එන සංඛ්‍යා දෙක හිස්තැන මත ලියන්න.

1 , 4 , 16 , 64 , ... , ...


21. කොළඹින් පෙරවරු 10.20 ට පිටත් වූ බස්රථයක් එදිනම පස්වරු 2.10 ට අනුරාධපුරයට ළඟා විය. බස් රථයට එම ගමන සඳහා ගත වූ කාලය පැය හා මිනිත්තු වලින් කොපමණ ද?

පැය ..... මිනිත්තු .....

22. බෝතල් දෙකක දොඩම් යුෂ 750ml හා 550ml ක් බැගින් ඇත.

1. බෝතල් දෙකෙහි ඇති මුළු දොඩම් යුෂ ප්‍රමාණය කොපමණ ද? .....
2. දොඩම් යුෂ පානය 2500 *l* ක් සෑදීමට ඉහත දොඩම් යුෂ ප්‍රමාණයට එකතු කළ යුතු ජල ප්‍රමාණය කොපමණ ද? .....

23. පහත හැඩතල ඇසුරින් සෑදිය හැකි ඝන වස්තුවේ



1. නම .....
2. වක්‍ර දාර ගණන .....

24. පොල් පැළ 900 ක් එක් පේළියකට පැළ 6 බැගින් සිටුවූයේ නම් එසේ සිටුවන ලද පේළි ගණන කීය ද? .....

ඉතුරු පැළ ගණන කීය ද? .....

25. පාන් පිටි 50kg ක ගෝනියකින් පාන් සෑදීම සඳහා පාන් පිටි 19kg 750g ක ප්‍රමාණයක් යොදා ගත්තේ නම් ඉතුරු පාන් පිටි ප්‍රමාණය කොපමණ ද? .....

✷ **පහත මිල දර්ශනය අනුව අංක 26 හා 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


ද්‍රව්‍ය	1kg ක මිල රුපියල් ශත
අල	420 . 00
කවුපි	470 . 00
කරවල	950 . 00
මිරිස්	480 . 00

26. මිරිස් 750g ක් සහ කරවල 500g ක් මිලදී ගැනීමට ගෙවිය යුතු මුළු මුදල කීය ද? .....

27. කවුපි 500 g ක් සහ අල 250g ක් මිලදී ගැනීමට රුපියල් 500 ක නෝට්ටුවක් දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කාසි සහ නෝට්ටුවලින් ගෙවිය යුතු ආකාරයක් ලියන්න.

.....

28. සිසුන් කණ්ඩායමක එක් එක් සිසුවා වඩාත් කැමති රස කැවිලි පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දක්වා ඇත. නමුත් කේක් වලට කැමති සිසුන් පමණක් ප්‍රස්තාරයේ ඇඳ දක්වා නැත.



කැවිලි වර්ගය

1. අලුවාවලට වඩා කොකිස්වලට කැමති සිසුන් ගණන කීය ද? .....

2. කණ්ඩායමේ සිටි මුළු සිසුන් ගණන 170 නම් කේක් වලට කැමති සිසුන් සංඛ්‍යාව ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

29. පොත් මිටියක පොත් 7 බැගින් පොත් මිටි 248 ක ඇති පොත් ප්‍රමාණය කොපමණ ද? .....

✷ **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. පහත දැක්වෙන මල් වර්ග අතුරින් වඩාත් ම සුවඳ හමන මල් වර්ගයකි.

1. වතුසුද්ද සහ ඉද්ද 2. කටරොළු සහ වද 3. පිච්ච සහ අරලිය

31. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ඉන්දියාවට,

1. උතුරින් 2. දකුණින් 3. නැගෙනහිරින්

32. මහවැලි ගඟ සහ කළු ගඟ මුහුදට වැටෙන ස්ථාන පිළිවෙළින් වන්නේ,

1. ගාල්ලෙන් , කොළඹින්
2. ත්‍රිකුණාමලයෙන්, කළුතරින්
3. කැලණියෙන්, කළුතරින්

33. පොලිතින් සම්බන්ධව පහත ලියා ඇති වගන්තිවලින් වැරදි ප්‍රකාශය තෝරන්න.

1. ඉවතලන ආහාර සහිත පොලිතින් කෑමෙන් සත්තු මිය යති.
2. පොලිතින් පිලිස්සීමෙන් පිටවන විෂ වායුව ලෙඩ රෝග සෑදීමට හේතු වේ
3. පොලිතින් දිරාපත්වීම ඉක්මනින් ම සිදුවන නිසා පස සරුවේ.

34. ශ්‍රී ලංකාවට උදාර සේවයක් කළ මෙම රූපයේ සිටින උදාර පුද්ගලයා කවුද?



1. ආචාර්ය ටී.බී. ජයා මහතා
2. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
3. ශ්‍රීමත් ඩි.බි. ජයතිලක මහතා

35. කාන්දම් කැබැල්ලට ඇදී එන ද්‍රව්‍ය යුගලයක් වන්නේ,

1. පිත්තල සහ යකඩ
2. ඇලුමිනියම් සහ පිත්තල
3. යකඩ සහ වානේ

36. රෝපණය කිරීමට සුදුසු බීජයක ලක්ෂණය වන්නේ,

1. නොමේරූ බීජයක් වීම
2. පිටපොත්ත පැල්ලම් රහිතව දීප්තිමත් වීම
3. බීජය අවපැහැ වීම

37. බීජ සහ අතු මගින් පැළවෙන ශාකයකි,

1. නිවිති
2. තක්කාලි
3. කරවිල

38. පරාග පෝෂණයට උපකාරවන සතුන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. පැණි කුරුල්ලා, ඇටි කුකුළා
2. සමනලයා, මී මැස්සා
3. මී මැස්සා, කපුටා

39. අපේ ශරීරය වර්ධනය කරන, ශක්තිමත් කරන ආහාර වර්ග දෙකක් පිළිවෙළින් ඇතුළත් වන්නේ,

1. හතු සහ බතල
2. මස් සහ රතු අල
3. මැඤ්ඤොක්කා සහ මාළු

40. විටමින් A ඌණතාවය නිසා වැළදෙන රෝගී තත්ත්වයක් වන්නේ,

1. තුවාල සුවවීම ප්‍රමාද වීම
2. කට කොන් වණ වීම
3. ඇස් පෙනීම දුර්වල වීම

41. ජලය හා බැඳුණු සංස්කෘතික සිරිතක් නොවන්නේ,

1. සිංහල අලුත් අවුරුද්දට ළිඳ හා ගනුදෙනු කිරීම
2. මංගල උත්සවවලදී දෙපා සෝදා මනමාලයා පිළිගැනීම
3. කෙස් කපා ජල භාජනයකට දැමීම

42. අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ,

1. පදික වේදිකාව මතින් ගමන් කිරීම
2. මාර්ග සංඥා එළි පුවරුවක් ''කොළ මිනිසා'' දර්ශනය වූ විට පාර හරහා මාරු වීම
3. දුම්රිය මාර්ගයේ ගමන් කිරීම

43. ඇඹුල් දැමීම නුසුදුසු වන්නේ කුමන භාජනයක ආහාර සකස් කරන විට ද?

1. ඇලුමිනියම් භාජන 2. මැටි භාජන 3. වීදුරු භාජන

44. මදුරුවන් අප වෙත ළංවීම වැලැක්වීම සඳහා ශරීරයේ තැවරීමට සුදුසු තෙල් වර්ගයක් වන්නේ,

1. පැඟිරි තෙල් 2. පොල් තෙල් 3. තල තෙල්

45. ගැඹුරු ළිඳකින් ජලය ඉහළට ගැනීම සඳහා භාවිත කෙරෙන වැඩ පහසු කිරීමේ යන්ත්‍රය වන්නේ,

1. කප්පිය 2. කරාමය 3. දැතිරෝදය

46. ශාක පත්‍ර ආහාරයට ගන්නා සතෙකි.

1. බකමූණා 2. සමනලයා 3. ගොළුබෙල්ලා

47. හාවාගේ ගමන් විලාසය ගැන කියවෙන වන්නමකි,

1. මුසලඩි වන්නම 2. තුරගා වන්නම 3. හනුමා වන්නම

48. ක්ෂීරපායී සතෙකු හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,

1. බිත්තර මඟින් පැටවුන් බිහිකිරීම 2. කිරි දී පැටවු පෝෂණය කිරීම
3. මස් පමණක් ආහාරයට ගැනීම

49. කාශ්‍යප රජතුමාගේ නිර්මාණයක් වූ සීගිරිය අයත් දිස්ත්‍රික්කය සහ පළාත වන්නේ,

1. අනුරාධපුර , උතුරුමැද පළාත 2. මහනුවර , මධ්‍යම පළාත
3. මාතලේ , මධ්‍යම පළාත

50. සුළඟ මගින් සහ පිපිරීමෙන් පැතිර යන බීජ ඇතුළත් වන්නේ,

1. කුඩළු , කෝමාරිකා 2. හොර , රබර් 3. පුළුන් සහ වරා

51. ව්‍යාජ අනුකරණවලින් යුතු භාණ්ඩ විකුණනු ලබන්නන් පිළිබඳ දැනුම් දිය යුත්තේ,


1. පොලීසියට 2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට
3. පාරිභෝගික ආරක්ෂණ අධිකාරියට

52. ඒක දේශික ශාක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. හොර , කොස්, තේක්ක 2. ගොඩපර, දෙල්, මැයි මාර
3. ගොඩපර, හීන්බෝවිටියා, කෙකටිය

53. A , B, C නම් කුඩා බල්බ තුනක්, යකඩ ඇණ 3 ක්, වියළි කෝෂයක්, ලෝහ ඇමුණුම් කටු දෙකක් හා වයර් කැබලි කිහිපයක් යොදා ගෙන ලෑලි කැබැල්ලක් මත රූපයේ දැක්වෙන ආකාරයේ ඇටවුමක් සකස් කර ඇත. මෙම ඇටවුම අනුව දැල්වෙන්නේ,

1. A බල්බය පමණි
2. B බල්බය පමණි
3. A , B, C බල්බ තුනම



54.




ඉහත රූපයේ දැක්වෙන උපකරණය භාවිත කිරීම වඩාත් සුදුසු වන්නේ,

1. යකඩ ඇණයක් ගැසීමට ය 2. ඉස්කුරුප්පු ඇණයක් ගැලවීමට ය
3. තහඩුවක් කපා ගැනීමට ය

55. ''උණ දඬු කපන තැන උණ දඬු රිකිල්ලා - බට දඬු කපන තැන බට දඬු රිකිල්ලා'' මෙය

1. පතල් කවියකි 2. පැල් කවියකි 3. පාරු කවියකි

56.




ඉහත බඳුන් තුනට නීරෝගී මෑ බීජ සමාන ප්‍රමාණවලින් දමා ඇත. බීජ පැළවීම සඳහා කුමන සාධකයක් අවශ්‍ය දැයි සෙවීමට මෙම පරීක්ෂණය යොදා ගන්නේ ද?

1. ආලෝකය 2. වාතය 3. තෙතමනය

57. සිතියමක මාර්ග හඳුන්වාදීමේ දී දම්පාට, කළුපාට, රතු පාට වර්ණ භාවිතා කරන්නේ පිළිවෙළින්,

1. මහාමාර්ග, දුම්රිය මාර්ග, අධිවේගී මාර්ග
2. අධිවේගී මාර්ග, මහා මාර්ග, දුම්රිය මාර්ග
3. අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, මහා මාර්ග

58. පහත ලේන්සුවේ වටේ මැසීමට සහ මල මැසීමට යොදා ගනු ලබන මැහුම් ක්‍රමය පිළිවෙළින්,



1. බිලැන්කට් මැස්ම සහ දම්වැල් මැස්ම
2. දම්වැල් මැස්ම සහ බිලැන්කට් මැස්ම
3. වාටි මැස්ම සහ දම්වැල් මැස්ම

59. ශරීරයට උණුවතුර වැටී පිලිස්සුණු අවස්ථාවකදී වහා ම කළ යුත්තේ,

1. පිලිස්සුණු ස්ථානයේ ආලේපයක් ගැල්වීමයි
2. පිලිස්සුණු ස්ථානයේ ගලා යන සේ ජලය දැමීමයි
3. පිලිස්සුණු ස්ථානය රෙදි කඩකින් ගැට ගැසීමයි

60. '' **අපි මාර්ග නීතිවලට අවනතව කටයුතු කරමු.** '' යන මාතෘකාවට අදාළ ව නිර්මාණාත්මක වැකි 3ක් ලියන්න. අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු අතර උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි විය යුතු ය.

1. .....

.....

2. .....

.....

3. .....

.....

අත් අකුරු සහ ඉලක්කම් පැහැදිලිව ලියා ඇත්නම් අතිරේක ලකුණු 02 පිරිනමන්න.



සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය



ප්‍රශ්න පත්‍ර අංක 06

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර
01	(2)
02	(1)
03	(2)
04	(2)
05	(3)
06	(5)
07	(1)
08	(2)
09	(3)
10	(1)
11	(3)
12	(1)
13	(2)
14	(3)
15	(1)
16	(1)
17	(2)
18	(2)
19	(3)
20	(1)

ප්‍රශ්න අංකය	පිළිතුර
21	(2)
22	(3)
23	(1)
24	(2)
25	(2)
26	(2)
27	(1)
28	(1)
29	(1)
30	(2)
31	(2)
32	(1)
33	(3)
34	(1)
35	(2)
36	(1)
37	(2)
38	(1)
39	(2)
40	(2)

PAST PAPERS WIKI